# 10 ශ්‍රේණිය සිංහල සාහිත්‍යය

# දෑතේ කරගැට සිඹ සනසන්නට

## 15 ඒකකය



**සැකසුම** - **හසිත හෙට්ටිආරච්චි**

**(Dip. In Sci. N.I.E./O.U.S.L.)**

(ආදර්ශ ප්‍රශ්න, පසුගිය විභාග ප්‍රශ්න, පළාත් ප්‍රශ්න, විචාර සහ පිළිතුරු අන්තර්ගත කර ඒකකය සම්පූර්ණයෙන් ම ආවරණය කර ඇත)

# 15 පාඩම
# දෑතේ කරගැට සිඹ සනසන්නට

1. දෑතේ කරගැට සිඹ සනසන්නට පද්‍ය පන්තියේ රචකයා කවුරුන් ද? එය උපුටා ගත්තේ ඔහුගේ කිනම් කාව්‍ය ග්‍රන්ථයෙන් ද?

.......................................................................................................................................

2. ඔහු උපන් ගම් ප්‍රදේශය නම් කරන්න

.......................................................................................................................................

3. ඔහු අයත්වන සාහිත්‍ය යුගය නම් කරන්න

.......................................................................................................................................

4. ඔහු නිර්මාණකරණයෙහි ලා තම සමත්කම් ප්‍රකට කළ විවිධ සාහිත්‍ය ක්ෂේත්‍ර මොනවා ද?

.......................................................................................................................................

5. ඔහු වඩාත් රසික විචාරක අවධානය දිනා ගත්තේ කුමන ක්ෂේත්‍රයේ ද?

.......................................................................................................................................

6. ඔහු ලියූ කාව්‍ය කෘති (පද්‍ය සංග්‍රහ) මොනවා ද?

.......................................................................................................................................

7. ඔහුගේ නාට්‍ය රචනා ගීත වෙන් කර දැක්විය හැකි දෙකොටසට මොනවා ද? ඒවා හඳුන්වන්න.

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

.......................................................................................................................................

8. ඔහු විසින් රචිත නාට්‍යය නම් කරන්න

.......................................................................................................................................

9. ඔහු විසින් රචනා කරන ලද නවකතා නම් කරන්න. ඉන් සිනමා කෘතියක් බවට පත් වූයේ කුමක් ද?

.......................................................................................................................................

10. ඔහු අතින් ප්‍රබන්ධිත ගීත මොනවා ද?

.......................................................................................................................................

11. ඔහු ලියූ ජනප්‍රිය නාට්‍ය ගීත මොනවා ද?

.......................................................................................................................................

12. මහගමසේකරට ආචාර්ය උපාධිය පිරිනමනු ලැබුවේ කවර නිබන්ධනයක් සඳහා ද?

.......................................................................................................................................

13. මෙම පාඩමේ සඳහන් පද්‍ය පන්තිය ඔහුගේ නො පළ ගීත කෘතියේ පළවුයේ කිනම් නාමයකින් ද?

.......................................................................................................................................

14. එය සංගීතවත් කළේ කවුරුන් විසින් ද?

.......................................................................................................................................

15. එය ගුවන් විදුලි ගීතයක් ලෙස ගායනා කළේ කවුරුන් විසින් ද?

.......................................................................................................................................

# 15 දෑතේ කරගැට සිඹ සනසන්නට - පසුගිය විභාග ප්‍රශ්න.

(x) දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය ඉදි කර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන්

2019 o/L

(අ) මෙම පද්‍යය ඇතුළත් නිර්මාණයේ රචකයාගේ නම කුමක් ද?
(ආ) පද්‍යයෙහි සඳහන් වන පරිදි කවියාගේ ප්‍රාර්ථනය කුමක් ද?

---

**(viii) සත් රුවනින් නව නිදහන් මතු වී**
**පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ**

2018 o/L

**(අ) මේ පද්‍ය ඛණ්ඩය මුලින් ම පළ වූ කෘතිය කුමක් ද?**
**(ආ) මේ කෘතියේ රචකයා විසින් රචනා කරන ලද නවකතා දෙක නම් කරන්න.**

---

**7.** ශ්‍රාවක සිත් තුළ සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට 'දෑතේ කරගැට සිඹ සනසන්නට' ගීතය සමත් වී ඇති ආකාරය උදාහරණ **තුනක්වත්** දක්වමින් විස්තර කරන්න. (ලකුණු 10 යි)

2017 o/L

---

(viii) දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි

2016 o/L

(අ) ඉහත ගීත ඛණ්ඩය ඇතුළත් ගීතයේ රචකයාගේ නම ලියන්න.
(ආ) 'දහදිය මුතු ඇට' යන්නෙහි ඇතුළත් කාව්‍යාලංකාරය කුමක් ද?

---

8. දහසක් වැව් බැඳි යෝද මිනිස් කැල
යොළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වටුණේ

Term test

(අ) කවියා ආර්ථික ශක්තිය සටහන් කළ කවි පදය උපුටා ලියන්න.
(ආ) 'දහසක් වැව්' , 'යෝධ මිනිස්' යන පදවල ව්‍යාකරණ ලක්ෂණ පෙන්වා දෙන්න.

(අ) චිත්‍රපටයකට නැඟුණු මහගම සේකරගේ නවකතාව කුමක් ද?
ආ) මහගමසේකරයන් විසින් රචනා කරන ලද පර්යේෂණ නිබන්ධනය කුමක් ද?

---

## පෙළ පොත විචාර ප්‍රශ්න.

1. මෙම නිර්මාණයෙන් ජාතික අභිමානයත්, ශ්‍රමාභිමානයත් ඉස්මතු කර ඇති ආකාරය පැහැදිලි කරන්න.

2. නිර්මාණකරුවා තම නිර්මාණය අර්ථ සම්පන්න කිරීමට අතීත ශ්‍රී විභූතිය යොදා ගෙන ඇති ආකාරය අගය කරන්න.

3. මෙම නිර්මාණයෙන් ඉස්මතු වන කවියාගේ ප්‍රාර්ථනා ඇගයීමට ලක් කරන්න.

4. මෙය රසවත් නිර්මාණයක් බවට පත් කිරීමට රචකයා යොදා ගෙන ඇති ධ්වනිතාර්ථ, භාවාර්ථ, රූපකාර්ථ, සංකේත වැනි රචනා උපක්‍රම විමසන්න.

Venuka

# 15 පාඩම
## දෑතේ කරගැට සිඹ සනසන්නට - පිළිතුරු

01. මහගම සේකර මහතා
ප්‍රබුද්ධ
02. සියනෑ කෝරළයේ හිරිඳිවැල්ල ආසන්න
රදාවාන ගම්මානය.
03. නූතන යුගයේ කවියෙක්
04. කාව්‍ය, නාට්‍ය, නව කතා, කෙටි කතා, චිත්‍ර කතා
පුවත්පත් කලා වැනි සාහිත්‍යාංග ක්ෂේත්‍ර
05. කාව්‍ය ක්ෂේත්‍රය
06. ප්‍රබුද්ධ
නොමියෙමි
සක්වාලිහිණි
07. ගීතාංග නාට්‍ය :- ගීත ගායනයෙන්
තොරව හුදෙක් කාව්‍ය සුවනයෙන්
සංවාද ඇතුළත් නාට්‍ය
ගීත නාට්‍ය :- ~~සංවාද~~ ගැයුම් සංවාද වලින්
තොර හුදෙක් ගායනයෙන් නාට්‍ය~~යෙන්~~
~~තොරම~~ ඉදිරියට ගෙන යාමයි.
08. සඳකිඳුරා
කුම්බිල්ලෙක්
හංස ගීතය
09. චමරෝමන්දියෙ
මනෝමන්දිරෙ
10. රන්නා දිය ජෝතිම ඇළි
අයස් එනු එනා කැදුම් බිඳු ගෙනා.
11. අන්න බලන් සඳ
අදින කදුකර හිමව් අරණේ.
12. ප්‍රබුද්ධ
13. පරජිනා නුවින්
14. ඩබ්ලිව්. ඩී. අමරදේව සූරීන්.
15. විමලා අමරදේව.

## 1.5 දියත් කරගට සිඹ සනසන්නට

1. දියත් කරගට සිඹ සනසන්නට පද්‍ය පන්තියේ රචකයා කවුරුන් ද? එය උපුටා ගන්නේ ඔහුගේ කිනම් කාව්‍ය ග්‍රන්ථයෙන් ද?
   - මහගම සේකර
   - ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහය

2. ඔහු උපන් ගම් ප්‍රදේශය නම් කරන්න
   - රදාවාන

3. ඔහු අයත්වන සාහිත්‍ය යුගය නම් කරන්න
   කොළඹ යුගයේ නිදහස් කවි පරපුර

4. ඔහු නිර්මාණකරුවෙකු ලෙස තම සමත්කම් ප්‍රකට කළ විවිධ සාහිත්‍ය ක්ෂේත්‍ර මොනවාද?
   - කාව්‍ය
   - ගීත
   - නාට්‍ය
   - නවකතා
   - කෙටිකතා
   - සිනමාව
   - චිත්‍ර කලාව
   - පුවත්පත් කලාව

5. ඔහු වඩාත් රසික විචාරක අවධානය දිනා ගන්නේ කුමන ක්ෂේත්‍රයේ ද?
   කාව්‍ය නිර්මාණකරණයෙනි.

6. ඔහු ලියූ කාව්‍ය කෘති මොනවා ද?
   - සක්වාලිහිණි, නොමියෙමි, ප්‍රබුද්ධ

7. ඔහුගේ නාට්‍ය රචනා ගීත රචනා ආදිය දැක්විය හැකි දෙකොටසට බෙදිය මොනවාද? ඒවා හඳුන්වන්න
   ජන ගී සම්ප්‍රදාය හා සම්භාව්‍ය සාහිත්‍යය

8. ඔහු විසින් රචිත නාට්‍ය නම් කරන්න
   - හංස ගීතය
   - සද්දන්ත
   - කුණ්ඩලකේශී

9. ඔහු විසින් රචනා කරන ලද නවකතා නම් කවරේ ද? ඉන් සිනමා කෘතියක් බවට පත්වූයේ කුමක්?
- තුංමංහන්දිය - සිනමා කෘතියක් බවට ද පත් විය
- මනෝමන්දිර

10. ඔහු අතින් රචිත ප්‍රබන්ධ ගීත මොනවාද?
- ප්‍රාර්ථනා

11. ඔහු ලියූ ජනප්‍රිය නාට්‍ය ගීත මොනවාද?
- අත්ත බලන් සඳ
- අඳුර කඳුමර හිමවී අරමෙන්

12. මහගම සේකරට ආචාර්ය උපාධිය පිරිනමනු ලැබුවේ කවර නිබන්ධනයක් සඳහා ද?
- පර්යේෂණ ග්‍රන්ථය

13. මෙම පාඩමේ සඳහන් ගීතය ඔහුගේ කො පළ ගීත කෘතියේ පළවූයේ කිනම් නමකින් ද?
- ප්‍රබුද්ධ කාව්‍ය සංග්‍රහයෙන

14. එය සංගීතවත් කළේ කවුරුන් විසින් ද?
- ඩබ්. ඩී. අමරදේවයන් විසිනි.

15. එය ගුවන්විදුලි ගීතයක් ලෙස ගායනා කළේ කවුරුන් විසින්ද?
- විමලා අමරදේව විසිනි

# 15 දෑතේ කරගැට සිඹ සනසන්නට - පසුගිය විභාග ප්‍රශ්න.- පිළිතුරු

(x) (අ) මහගමසේකර

2019 o/L

(ආ) පුතු වෙනුවෙන් ලෝකය ඉදිකර දීම

(viii) (අ) ප්‍රබුද්ධ

2018 o/L

(ආ) කුං මං හංදිය, මනෝ මන්දිර

අපේක්ෂිත පිළිතුර හා ලකුණු දීමේ පටිපාටිය

★ සමෘද්ධිමත් රටක් සඳහා ශ්‍රමදායකත්වයේ වටිනාකම ජනිත කරවීමට

i. "දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දලු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි"

2017 o/L

මහන්සි වී වැඩ කරගන්නන්ට සොබාදහම පවා සතුට, සැනසීම ලබා දෙන බව කවියා අපූර්වත්වයෙන් කියාපායි.

ii. "දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ"


අතීතයේ අපේ මුතුන් මිත්තෝ මහන්සි වී තම බාල පරම්පරාව වෙත බොහෝ දේ දායාද කළහ. වර්තමානය ගොඩ නැගී ඇත්තේ ඒ අතීත යෝධ මිනිසුන්ගේ ශ්‍රම දායකත්වයෙනි.

iii. "මා ගත වෙහෙසට ආදරයෙන් දිය
උල්පත පාදන පුංචි පුතුන්
ඒ ගත වෙහෙස ම සතුටක් වෙයි මට
ඔබ සිහිවන විට පුංචි පුතුන්"

මහන්සි වී වැඩ කිරීමෙන් රටේ ඇතිවන සංවර්ධනය බාල පරපුර වෙත දායාද කිරීම සතුටකි.


මේ නිදසුන් මගින් රටේ සමෘද්ධිය සඳහා ශ්‍රම දායකත්වයේ වටිනාකම කාව්‍යෝපක්‍රම භාවිත කරමින් ඉදිරිපත් කර ඇති ආකාරය විස්තර කර තිබිය යුතු ය.

ප්‍රශ්නය සඳහා ලකුණු ලබා ඇති ආකාරය




"දෑතේ කරගැට සිඹ සනසන්නට" පද්‍ය පන්තිය පාදක කර ගෙන සැකසුණු මෙම ප්‍රශ්නය තෝරා ගෙන ඇති අයදුම්කරුවන් සංඛ්‍යාව 31%කි. මෙහි සමස්ත පහසුතාව 71%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු 10ක් හිමි වේ.

ඉන් ලකුණු 00 - 02 ප්‍රාන්තරයේ 5%ක් ද
ලකුණු 03 - 05 ප්‍රාන්තරයේ 10%ක් ද
ලකුණු 06 - 07 ප්‍රාන්තරයේ 28%ක් ද
ලකුණු 08 - 10 ප්‍රාන්තරයේ 57%ක් ද
ලබා ගෙන ඇත.




"දැනේ කරගැට සිඹසනසන්නට" පද්‍ය පන්තිය ඇසුරෙන් පිළිතුරු සපයා ඇති අයදුම්කරුවන්ගෙන් 15%ක් ලකුණු 06 ට වඩා අඩුවෙන් ලබා ගෙන ඇත. 0ත් 2ත් අතර ලකුණු ලබා ගෙන ඇති පිරිස 5%කි. ලකුණු 6-10 ලබා ඇති අයදුම්කරුවන්ගේ ප්‍රතිශතය 85%කි. ඒ අනුව පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නයට අයදුම්කරුවන් සපයා ඇති පිළිතුරු ප්‍රශස්ත මට්ටමක තිබූ බවයි.

මෙම ප්‍රශ්නය තෝරා ගැනීමේ ප්‍රතිශතය 31%ක් වුවත් එහි පහසුතාව 71%ක් වීමෙන් පැහැදිලි වන්නේ මෙම ප්‍රශ්නය තෝරා ගත් අපේක්ෂකයන් මධ්‍යස්ථ මට්ටමක ලකුණු ලබා ගෙන ඇති බවයි.

පිළිතුරු සැපයීමේ දී III වන ප්‍රශ්න පත්‍රය පිළිබඳ ව පොදුවේ බලන කල වැඩි ම පහසුතාව ලබා ගත් ප්‍රශ්න ලෙස පිළිවෙළින් 1, 7 දැක්විය හැකි ය. එවායේ පහසුතාව පිළිවෙළින් 62% සහ 71%කි.

2, 4, 5 ප්‍රශ්න පිළිවෙළින් 49%, 48% සහ 46% පහසුතා පෙන්නුම් කරන අතර, 3, 6 ප්‍රශ්න සඳහා 55% සහ 57%ක පහසුතාව පෙන්නුම් කරයි. මේ අනුව අඩු ම පහසුතාවක් දක්වන්නේ 5 වන ප්‍රශ්නයටය. එහි පහසුතාව 46%කි. ඒ අනුව III වන ප්‍රශ්න පත්‍රයේ සමස්ත පහසුතාව 55%කි.

---

(viii) (අ) මහගමසේකර

(ආ) රූපක

**2016 o/L**

---

VIII. (අ) සත් රුවනින් නව නිදහන් මතු වී

(ආ) විශේෂණ පද නිම විශේෂණ

**Term test**

(ආ) තුංමං හන්දිය

ආ) සිංහල ගද්‍ය පද්‍ය නිර්මාණයන්හි රිද්ම ලක්ෂණ



## 15 . දෑතේ කරගැට සිඹ සනසන්නට...

01. මෙම නිර්මාණය තුළින් ජාතික අභිමානයත්, ශ්‍රමාභිමානයත් ඉස්මතු කර ඇති ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ නිදහස් කවි පරපුර නියෝජනය කළ නිදහස් කවි රීතියක් උපයෝගී කරගත් ප්‍රතිභාවපූර්ණ කවියෙකු වූ මහගමසේකරයන් විසින් රචනා කළ 'ප්‍රබුද්ධ' නැමැති කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් මෙම අගනා කාව්‍ය නිර්මාණය මාහැඟි කාව්‍ය සංකල්පනාවක් වේ.

දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි....

පූර්වෝක්ත උපුටනෙහි අන්තර්ගතවන ලෙස දක්වා ඇත්තේ රටේ ශ්‍රම බලකායට මහත් දායකත්වයක් සපයන ගොවි ජනයා ඉතා වෙහෙස මහන්සි වූ ආකාරයයි. ඔහු හෙලන දහදිය මුතු ඇට වලට සමාන කරන කවියා එය මල් වරුසාවක් වී ගොයම් කරල් පීදෙන ආකාරය හුවා දක්වයි. කෙතේ අස්වනු පීදෙන්නේ ගොවියාගේ ශ්‍රමාභිමානයේ ප්‍රතිඵලයක් ලෙසිනි.

දහසක් වැව් බැඳි යෝධ මිනිස් කැල
යළි ඉපදී ඇති මවු දෙරණේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාවෙනි ඔප වැටුණේ....

විදේශික ආක්‍රමණිකයන් පවා විස්මයට පත් කළ වැව් බැඳි අතීත මුතුන් මිත්තන් තම මරණයෙන් පසු යළි ඉපදී ඇති මව්බිමෙහි සත් රුවන් නිධානයක් පහළ වී ඇති සෙයක් කතුවරයා උක්ත පැදිකඩෙන් නිරූපණය කරයි. ඒ උදාර මිනිස් කැල සමඟ එක්ව නව පුනරාරම්භයක් ඇති වන ආකාරය, රටේ ඇතිවන ආර්ථික සංවර්ධනය දකින පුංචි පුතා සිහිනයෙන් පවා සිනාසෙයි. ඒ අතීත විරුවන් සිහි කිරීමෙන් ඇති වන ජාතික අභිමානය ඉස්මතු කිරීමට කවියා දක්වන කුසලතාවයයි.

දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ...

දෑසේ කඳුලු පිසදා බැලූ කළා හෙට දින අරුණාලු පැහැ දිදුලනු නියතය. ණය නැති බිය නැති නිවහල් යුගයක සමාරම්භය ඉන් සනිටුවහන් වෙයි. පුංචි පුතා අනාගතයේ දිනක රජ කරන ආකාරය දකින කවියා ඒ ඔස්සේ සහෘදයා තුළ අනාගත අපේක්ෂාවන් දල්වයි. අභිමානවත් රටක් , හෙට දිනක් ප්‍රාර්ථනා කරයි.

මෙලෙස ජන කවියෙන් ලත් අභාෂයෙන් ද තම ජීවිත අත්දැකීම් වලින් ලත් පන්නරයෙන් ද සරල වදන් ගොමුවකින් ගැඹුරු අරුත් සම්පාදනය කරමින් ශ්‍රමාභිමානයත් ජාතිකාභිමානයත් ඉස්මතු කරලන්නට මහගමසේකරයෝ සමත් වූහ.

# 15 . දෑතේ කරගැට සිඹ සනසන්නට...

02. මෙය රසවත් නිර්මාණයක් බවට පත් කිරීමට රචකයා යොදා ගෙන ඇති ධ්වනිතාර්ථ, භාවාර්ථ, රූපකාර්ථ, සංකේත වැනි රචනා උපක්‍රම විමසන්න. (ලකුණු 10)

කොළඹ යුගයේ නිදහස් කවි පරපුර නියෝජනය කළ නිදහස් කවි රීතියක් උපයෝගී කරගත් ප්‍රතිභාවපූර්ණ කවියෙකු වූ මහගමසේකරයන් විසින් රචනා කළ 'ප්‍රබුද්ධ' නැමැති කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් මෙම අගනා කාව්‍ය නිර්මාණය මාහැඟි කාව්‍ය සංකල්පනාවක් වේ.

දෑතේ කරගැට සිඹ සනසන්නට
ළා ගොයමේ දළු පවන් සලයි
දහදිය මුතු ඇට මල් වරුසා වී
කරල් බරින් පීදී වැගිරෙයි....

පූර්වෝක්ත උපුටනෙහි අන්තර්ගතවන ආකාරයට කවියා දක්වා ඇත්තේ රටේ ශ්‍රම බලකායට මහත් දායකත්වයක් සපයන ගොවි ජනයා ඉතා වෙහස මහන්සි වූ ආකාරයයි. කෙතේ අස්වනු පීදෙන්නේ ගොවියාගේ ශ්‍රම දායකත්වයේ ප්‍රතිඵලයක් ලෙසිනි. දෑතේ කරගැට සිඹ සනසන්නට ලෙස සරල යෙදුමකින් එය ධ්වනිතාර්ථවත් කරන්නට කවියා සමත් වෙයි. අස්වනු පීදීමෙන් සශ්‍රීක හෙට දවසක් සංකේතවත් කරයි. ගොවියා හෙලන දහදිය මුතු ඇට වලට සමාන කරන ඔහු අගනා රූපකාර්ථ යොදා ගනිමින් තම නිර්මාණය වඩාත් ඔප් නංවයි.

අඩ සඳ මෝරන මැදියම් අහසින්
බිලිඳු හදට කිරි දියර ගලයි
හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුංචි පුතා හීනෙන් හිනැහෙයි...

මැදියම් අහසේ මෝරා එන අඩ සඳින් විහිදුණු චන්ද්‍රාලෝකයෙන් ප්‍රමුදිත කවියා ළමා හදවත් තුළට සඳ රැස් ඔස්සේ කිරි දියර මෙන් සෞම්‍ය සිතිවිලි දහරා ගලා එන බව කියයි. සංකේතාර්ථවත් වුත් භාවාර්ථවත් වුත් මෙම ප්‍රතිභාපූර්ණ මාහැඟි පද සංයෝජනය අර්ථාන්විතය. එයින් පිනා යන පුංචි පුතු හීනෙන් හිනැහෙයි.

දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ණය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ...

දෑසේ කඳුලු පිසදා බැලූ කළ හෙට දින අරුණලු පැහැ දිදුලනු නියතය. ණය නැති බිය නැති නිවහල් යුගයක සමාරම්භය ඉන් සනිටුවහන් වෙයි. පුංචි පුතා අනාගතයේ දිනක රජ කරන ආකාරය දකින කවියා ඒ ඔස්සේ සහෘදයා තුළ අනාගත අපේක්ෂාවන් දල්වයි. ණය නැති බිය නැති ලෙස අනුප්‍රාස රසයද යොදාගෙන තිබීමෙන් කාව්‍ය වඩාත් රසවත් වී ඇත.

මෙලෙස ජන කවියෙන් ලත් අභාෂයෙන් ද තම ජීවිත අත්දැකීම් වලින් ලත් පන්නරයෙන් ද සරල වදන් ගොමුවකින් ගැඹුරු අරුත් සම්පාදනය කරමින් ද ධ්වනිතාර්ථ, භාවාර්ථ, රූපකාර්ථ, සංකේතාත්මක රචනා උපක්‍රම භාවිත කරමින් භාව පූර්ණ අතිශය සාර්ථක කාව්‍ය නිර්මාණයක් බිහි කිරීමට මහගමසේකරයෝ සමත් වූහ.

නිර්මාණකරුවා තම නිර්මාණය අර්ථ සම්පන්න කිරීමට අනීත ශ්‍රී විඥානිය යොදා ගෙන ඇති ආකාරය අගය කරන්න.

කාව්‍ය, ගීත, නාට්‍ය, කෙටි කතා, නව කතා චිත්‍ර කලාව හා නූතන් තේ කලාව වැනි සාහිත්‍යාංගයන් මගින් නිර්මාණ ඉදිරිපත් කල මහගම සේකර ශූරීන් විසින් රචිත "ප්‍රබුද්ධ" නම් කාව්‍ය කෘතියේ එන දූනේ කරගැට සිව සනසන්නේ නම් කාව්‍ය සංග්‍රහයේ ඔහුගේ නිර්මාණයේ අර්ථ සම්පන්න කිරීමට අනීත ශ්‍රී විඥානිය යොදා ගෙන ඇති ආකාරය මෙසේ දැක්විය හැකිය.

කාව්‍ය සංග්‍රහයේ සඳහන් පරිදි දරුවාණෙට ඇති කරවන ශ්‍රී විඥානිය මෙසේ දැක්විය හැක.

අඹ සැළ තෝරණ වැදියවී අහසින්
බිලිඳු හදට කිරි දියර ගලයි
හෙට ඉදි වන නව ලෝකය දැක දැක
පුරවි පුතා හිනෙන් නිකාවෙයි

පරිපූර්ණ වූ නව ලෝකය කා හිටින දරුවාට මෙසේ එහි සාරවත් බව නිර්මාණකරුවා විසින් ශ්‍රී විඥානිය පෙන්වන්නේ මෙසේය "බිලිඳු හදට කිරි දියර ගලයි" නම්නි. එසේ දරුවාට ඇති කරන ශ්‍රී විඥානිය මගින් තම කාව්‍ය නිර්මාණය සාර්ථක කිරීමට කවියා මහගු මෙහෙයක කියලෙයි.

දුකසක් වැව් බැදි යෝධ මිනිස් කැල
සැලි ඉසුරු ඇති වූ දෙරණේ
සත් රුවනින් නොව නිදහස් වනු වී
රජුගේ සිනාවෙනි බව වැටුණේ

~~[illegible]~~ වැව් දුකස් ගණන් නිම කරන ලද මහා විරුවන් නැවත මෙම දිවිය ඉපදී නැවතත් රට සශ්‍රීක කරන බව හගවන කාව්‍ය රචකයා එම උත්කාලීනාරයක්. නව ලේඛකයන් තුල ඇති කරන ලේඛාභිමානය ඔවුන් තුල ගෞරවාන්විත කරවයි. කාව ද මහා විසල් සංචිතන් දායාද වන පුතුට මහා ආඩම්බරයක් අභිමානයක් ගෙන දීමට කවියා උත්සාහ කරයි. ~~මෙසේ [illegible]~~ ඒ අනුව මෙම කාව්‍ය නිර්මාණය වඩාත් ජීවගැන්වෙන බව නො අනුමානයි.

දුදනේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
ගීය නැති බිය නැති නිවහල් යුගයක
පුරවි පුතා රජ කරනු පෙනේ.

දුකින් තොරව සතුටු වන කාලය එළඹෙන කාල මතු දිනයක මහා වටිනා මව් දෙරණින් වෙද්දී පුරවි පුතුට හිරු එළිය වැටුනු දිනයේ

-වෙත් පෙර පැවති අඳුරු කාලය
බැගැහෙත් දුක නැවති අඳුර ඉවත්ව
යෙෂ් සතුට නැගී ආලෝකය
පැමිණේ ඒ අනුව ශ්‍රී විදැතිය
දරුවාට නොඅඩුව ලැබෙනවා නොඅනුවාසය
ඒ අනුව ගැහැණුන් තුල පැවති නිර්වාණ
කෞශල්‍ය වෙසේ විදහාපානු ලබයි.
තවද මෙම දරුවාගේ භාරකාරයාට
අනාගතයේ ඉදිවන ඉසුර සම්පත්ති
බැත්වෙන නව ලෝකය තුල සිටින
රජු ලෙස ශ්‍රාවකයාට ගමන කිරීම
නිර්වාණකාරු සමත් කම් දැක්වීම ට
මෙහෙස දරයි. ඒස් ඒසේ මෙම මෙම
කාව්‍යය සංකල්පය ශ්‍රාවකයාට ශ්‍රී විදැතිය
ගෙන දෙමින් මධ්‍යම හා විචිත්‍ර
නිර්වාණයක් බවට පත් වෙයි.

| | | |
|---|---|---|
| උදාහරණ සඳහා ලකුණු | 03 යි | 03 |
| සමස්ත විස්තරයට ලකුණු | 07 යි | 06 |
| මුළු ලකුණු | 10 යි | 09 |

09/10

Venuka Nimsara
D.S Senanayake College



## 15. දෑතේ කරගැට සිඹ සනසන්නට...

මහගම සේකර (1929 - 1976)

10/10

Indumini Dissanayake
Visakha Vidyalaya

මෙම නිර්මාණයෙන් ශෘංගාභිලාෂයන්, රතිකාභිලාෂයන් ඉස්මතු කර ඇති ආකාරය ශ විමසිලි කරන්න.

කොළඹ යුගයේ නිදහස් කවි ව්‍යාපාර නියෝජනය කළ කවියෙකු, ගීත රචකයෙකු, ප්‍රබන්ධ සාහිත්‍යකරුවෙකු, චිත්‍ර ශිල්පියෙකු හා සිනමාකරුවෙකු හැටියට අපූර්ව ප්‍රතිභාවක් හා පරිකල්පනයන් ලත් මහගමසේකරයාණන් විසින් විරචිත "ප්‍රබුද්ධ" කෘතියෙන් උපුටා ගන්නා ලද "දෑතේ කරගැට සිඹ සනසන්නට" කාව්‍ය නිර්මාණය හොඳම කාව්‍ය සංකල්පනාවකි. ලක් දේශයේ සමාජ යථාර්ථය හා සමාජ සන්දර්භය පදනම් වියෝගාත්මක ලෙස නිසුරු බැල්මක් හෙළා කවියා සිය කාව්‍ය සංකල්පනාව ඔපවත් කරයි. මෙම කාව්‍යයන්ට වස්තු විෂය වූයේ අනාගත සම්බුද්ධිය උදෙසා කර ගැනීමට පෙර දරන බෝසතාණන්ගේ අර්ථ ගවේෂණය, ශෘංගාභිලාෂයන් හා රතිකාභිලාෂයන් දැනුව

පුකට කිරීමයි. කාව්‍ය සංකල්පනාව අසන, කියවන ශ්‍රාවකයාට හෝ පාඨකයාට රටේ ශ්‍රී සමෘද්ධියෙන් යුක්තව, ජාතිකාභිමානයෙන්. ශ්‍රමාභිමානයෙන් සිය ඥාන මණ්ඩලය හා භාව මණ්ඩලය නිරායාසයෙන්ම උද්දීප්ත වනු නිසැකය. නිදහස් ආකෘති රටාවකින්, සරල, සුගම, තේරුම් ජන වහර උකහා ගනිමින් කාව්‍ය-කරණයට හා ගීතකරණයට යොමු වූ මෙම ශ්‍රේෂ්ඨ කලාකරුවාණන් ජාතික අභ්‍යුදය සඳහා කරළ ළද සේවය අනල්පය.

මහගමසේකරයන් මෙම ගී පෙළ තුළ ජාතිකාභිමානය තම පහද හදවත් තුළ ජනිත කිරීමට දරා ඇති එක් ප්‍රයත්නයක් මෙසේ ය.

"දෑසේ කඳුළැලි පිසදා බලමෙනි
ඔබට හිරු එළියට එවන දිනේ
භය නැති බිය නැති නිවහල් යුගයක
පුංචි පුතා රජ කරනු පෙනේ"

රටේ අනාගත පරම්පරාවේ පුතුනම. වගකීම වන්නේ අතීතයේ සිදු වූ වැරදි ගැන තැවෙමින්, කඳුළු සලමින් සිටීම නොව, එම වැරදිවලින් ආදර්ශයක් ගෙන තම රටේ අනාගතය ගොඩ නැගීම බව කවියා පවසයි. එලෙසටම ශක්තිය දෙන සූර්යයාගේ ශක්තිය ලබාගෙන, භයෙන් හා බියෙන් තොර ස්වාධීන

රාජ්‍යයක් "රහට" තරම් නුදුරු අනාගතයක දී ම නිදි කර ගන්නට පුංචි පුතුන්ට හැකියාව ලැබේවා යන්න බමුණගේ පරම ප්‍රාර්ථනයයි. මෙලෙස කිසිවෙකුට නොයටත්, ස්වාධීනව වැජඹෙන රාජ්‍යයක දිවි ගෙවීමේ වාසනාව දිනා ගැනීම සඳහා සේකරයෝ පාඨක පවුර තුළ ජාතිකාභිමානය ජනිත කරවීය.

"දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය පුංචි පුතුන්
ඔබ හට ලෝකය තුදී කර දී මිස
යා නොහැකිය මට පුංචි පුතුන්"

ලංකාව පිළිබඳ ලිඛිත ඉතිහාසය ආරම්භ වූ කාලයේ; සිංහලයන් බිහි වූ දා පටන්, විජය ඇදින් වසර දෙදහස් පන්සියයකට පමණ පෙර කාලයේ සිට අද දක්වාම ඇවිසිටි පරම්පරාව තුළ පැවති සිහිනය වූයේ බාල දරු පැටවුන්ට අනාගතයේ ජීවත් වීමට වඩාත් හිතකර ලෝකයක් නිර්මාණය කිරීමයි. සෑම ඇවිසිටියෙකුම තමාට පිදී යා නොහැකි එම වගකීමෙන් බැඳී සිටියි. සියවස් ගණනක් ගත වුවද, එම සිහිනය තවමත් මල් පී නොමැති නමුත්, නුදුරේදීම එය සැබෑවනු ඇතැයි, කවියාගේ ප්‍රාර්ථනයයි. මෙලෙස තම පද පන්තිය තුළින් මහගම සේකරයෝ ජාතිකාභිමානය පමණක් නොව ශූරාභිමානය ද ජනිත කරයි.

"දහසක් වැව බැඳි යෝධ මිනිස් කැල
සලි ලූවිදි ඇති මේ දෙරටේ
සත් රුවනින් නව නිදහන් මතු වී
පුතුගෙ සිනාපෑවනී බව වැටෙන්"

මේකරුගෙයෝ, දහසක් වැව බැඳි යෝධ මිනිස් කැල සලි ලත් දෙරටට ප්‍රාදුර්භූත වූ බව සහෘදයාට ප්‍රකාශය කර ඇති ආකාරය විචිත්‍රය. යන්ත්‍ර සූත්‍ර වත් නොතිබුණු යුගයක පැරණි ලාංකිකයන්ගේ එකමුතුවෙන් මහා වැව් වන තැනීමට හැකි වූ බව පැවසීමෙන් කවියා ඔවුන්ගේ ශ්‍රමාභිමානය ව්‍යුත්පන්න කරලයි රට තුළ නව නිදහන් මතු වූවාක් මෙන් රටට, ජාතියට නැවත සම්ප්‍රාප්ත වූ ශ්‍රී උදාර, යෝධ මිනිස් කැලගේ පුනරාගමනයෙන් නව ජීවයක් ලබා පුංචි පුතා සිහිනෙන් වත සිනාසෙන අයුරු මෙම කාව්‍ය ඛණ්ඩයෙන් පැහැදිලි වේ.

එදා සිට අද දක්වා මෙරට පහළ වූ, දහසක් වැව බැඳි, අත්කර ගෙන කෙත්වතු වගා කළ නිවහල් දේශයක් සඳහා දිවි හිමියෙන් සටන් වැදි අතීත පෙළයන් ප්‍රත්‍යාවලෝකනය කිරීමෙන් මහගමසේකර කිවිඳාගේ මෙහිදී සහෘද මනෝ මණ්ඩලයන් තුළ ජාතික අභිමානය හා ශ්‍රමාභිමානය එකසේ ජනිත කරලීමෙන්, සරල, සුගම, නිරලංකාරශීලී වෙස් වහරක් තම අදහස් ප්‍රකාශනයටත් ඇ චාතුර්යය, ප්‍රශස්ත බව මෙම කරුණුවලින් මනාව ස්ඵුට වේ.

02. ~~[illegible]~~ නිර්මාණකරුවා තම නිර්මාණය අර්ථ සම්පන්න කිරීමට අතීත ශ්‍රී විභූතිය යොදා ගෙන ඇති ආකාරය අගය කරන්න

මහගම සේකර කවියාණන් විසින් රචිත ප්‍රබුද්ධ නම් කාව්‍ය සංග්‍රහයෙන් උපුටා ගත් රසවත් නිර්මාණයකි පුහුණ කී කවි පෙළ. කවියා සිය නිර්මාණය අර්ථ සම්පන්න කිරීමෙහි ලා අතීත ශ්‍රී විභූතිය යොදා ගෙන ඇති බව පෙනේ. දේශයේ අතීත ශ්‍රී විභූතිය සිහිගන්වමින්, ශ්‍රාවකයා තුළ දේශාභිමාන ජාත්‍යාභිමාන හා ආත්මාභිමාන සංකල්ප ජනිත කරවමින්, සමෘද්ධිමත් හෙට දිනයක් පිළිබඳ අනාගත අපේක්ෂා දල්වන අර්ථ සම්පන්න විශිෂ්ට නිර්මාණයක් බිහි කිරීමට කවියා සමත් වෙයි මේ බව නිදසුනකි.

"දහසක් වැව් බැඳි යෝධ මිනිස් කාල
යළි ඉපදී ඇත මුළු දෙරණේ
සත් රුවනින් තම නිදහස මතුවී
පුතුගෙ සිනාවෙන් මව මැවුණේ"

කවියා මෙසේ අතීත ශ්‍රී විභූතිය සිහි ගන්වමින්, දහසක් වැව් බැඳි යෝධ මිනිස් කාල, මෙරට භූමියෙහි යළි ඉපදී ඇති බව සඳහන් කරයි. එසේම අතීත මිනිස් කාල පෙරටු බලය, ධෛර්ය මෙහෙය ආදර්ශයට ගෙන, සමෘද්ධිමත් හෙට දිනයක් උදා කර ගන්නා ලෙස, කවියා සමස්ත ජනතාවගෙන් ඉල්ලීමක් කරයි. සත් රුවනින් තම නිදහස මතුවීම යනු එසේ අනාගත සෞභාග්‍ය උදා කිරීමයි. මිනිසුන් තුළ, අනාගත අපේක්ෂා දල්වන විශිෂ්ට නිර්මාණයක් ලෙස මෙම කවි පන්තිය ගත හැක.

"දෑසේ කඳුළැලි පිසදා බලනෙමි
හෙට හිරු එළියට වඩින දිනේ
භය නැති බිය නැති නිවහල් යුගයක
ඉපිදී ඉනා රට කරනු පෙනේ"

'දෑසේ කඳුළැලි පිසදා බලනෙමි' යනුවෙන් අදහස් කරනුයේ විදේශාධිපත්‍යයට යටත්ව වී, පරාජිත ව සිටි යුගය ගැන, පසුතැවෙන්නෙ නැතිව, ඒවා අමතක කොට ඉදිරි අනාගතය ගැන සිතිය යුතු බවයි. 'හෙට හිරු එළියට වඩින දිනේ' යනු අනාගත අභිවෘද්ධිය, සමෘද්ධිය නො පමාව සලසා ගන්නා දිනය උදා කර ගැනීමයි. 'භය නැති බිය නැති

නිවහල් යුගයක, ඉරුටු පුතා රට කරනු පෙනේ" යන්නෙන් සමුපුරුවන් ධනවාදීන්ට යටත් නොවී තමන්ගේ මාතෘභූමිය වෙනුවෙන් යුතුකම් හා වගකීම් ඉටු කොට, එම යාගයෙන් ද නිදහස් වී, නිවහල් යුගයක අභිමානවත්ව ලබා ගත දවසට සොයාගෙන උදාවන බවය.

මෙහි දී නිර්මාණය අර්ථසම්පන්න කිරීමෙහි ලා කවියා අතීත ශ්‍රී විභූතිය පිළිබඳව යොදා ගැනීම අතිශයින්ම විචිත්‍රවත් වූ බව පෙනේ යයි.

"දෙදහස් පන්සිය වසරක් තිස්සේ
මා දුටු සිහිනය ඉරුටු පුතුනි
ඔබ හට ලෝකය අදි කර දී මිස
යා නො හැකි ය මට ඉරුටු පුතුනි"

අවුරුදු දෙදහස් පන්සිය වසරකටත් එහා සිට, අර්ථ මුතුන් මිත්තන දුටු සිහිනය හැටියට, කවියා දකින්නේ අනාගත පරපුරේ අභිවෘද්ධියයි. "ඔබ හට ලෝකය අදි කර දී මිස, යා නො හැකි ය මට ඉරුටු පුතුනි" යයි කවියා පවසන්නේ එම වගකීම් සම්භාරය පිළිබඳව ය. සෑම ලාංකික පුරවැසියකු විසින් ම ඉටු කළ යුතු බොහෝමත් කවි අතීත මී මුතුන් අපට පැවරූ දායාද, ගෙන් වැඩි දියුණු කරමින් අනාගත පරපුර වෙත පිරිනැමීම යි.

මෙසේ ජාතිකාභිමානය, ශූරාභිමානය යන සංකල්පය පුරවැසියන් තුළ ඇතිව කිරීමට, කවියා අතීත ශ්‍රී විභූතිය පිළිබඳ තාර්කික කාරණා ඉවහල් කර ගනී. මෙම කවි පෙළ වර්ණනයේ කට වචනයෙන් පමණක් රට සංවර්ධනය කරමින්, තමන්ගේ ම බඩ වඩා ගැනීමට උත්සාහ දරන, ඔලුවෝභී නායක කාරකාදීන්ට ද කවියා කරන අභියෝගයකි.

09
10

Chamidu
Methjaya
Royal college